**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය**

**සහ**

**පරිගණක පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

# <u>2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා තොරතුරු පද්ධති උපාධි පාඨමාලාවට (096T/096C) අයදුම්කරුවන් තෝරා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණය</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2021/2022" අත්පොතෙහි 1.2 සහ 2.2.8.26 ඡේදයන්හි දැක්වෙන විශ්වවිද්‍යාලයකට ඇතුලත්වීම සඳහා වන සුදුසුකම් සපුරා ඇති 2021 අ.පො.ස. (උ.පෙ.) විභාගය සමත් අයදුම්කරුවන්ගෙන් 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා තොරතුරු පද්ධති උපාධි පාඨමාලාවට (096T/096C) අයදුම්කරුවන් තෝරා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

මෙම පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසිනි.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිගණක පීඨයේ ඉහත සඳහන් උපාධි පාඨමාලාව වෙනුවෙන් බඳවා ගැනීම සලකා බැලීම සඳහා මෙම යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීම පූර්ව අවශ්‍යතාවයක් වේ.

ඒ අනුව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිගණක පීඨයේ තොරතුරු පද්ධති උපාධි පාඨමාලාවට සලකා බැලීම සඳහා 2021/2022 අධ්‍යයන වර්ෂයේ සිසුන් බඳවා ගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් තම කැමැත්තෙහි අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහන් කර මෙම යෝග්‍යතා පරීක්ෂණයට අයදුම් කර පෙනී සිටිය යුතුය.

සැ.යු. - යෝග්‍යතා පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වන බව සලකන්න.

**සැලකිය යුතු දිනයන්**

| | |
|---|---|
| අයදුම්පත් බාරගන්නා අවසාන දිනය | : 2022 සැප්තැම්බර් 23 |
| විභාග ප්‍රවේශ පත්‍ර නිකුත්කිරීම | : 2022 සැප්තැම්බර් 27 සිට 2022 ඔක්තෝම්බර් 02 |
| යෝග්‍යතා පරීක්ෂණය පවත්වන දිනය සහ වේලාව | : 2022 ඔක්තෝම්බර් 02<br>පෙ.ව.10.00 සිට මධ්‍යාහන 12.00 දක්වා |
| විභාගය පවත්වන ස්ථානය | : කොළඹ |

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ පිළිවෙල** :

1. සියළු අයදුම්කරුවන් අයදුම් පත්‍රය 2022 සැප්තැම්බර් 23 ට පෙර https://ucsc.cmb.ac.lk/istest/ සම්පූර්ණ කළ යුතුය. යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම් කල හැක්කේ ඉහත අයදුම් පත්‍රය මගින් පමණි.
   **සැලකිය යුතුයි:** කිසිම හේතුවක් මත තමන් විසින් සකසා ගත් හෝ මුද්‍රණය කරන ලද අයදුම්පත් බාර නොගන්නා බව සලකන්න.
2. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ගිණුම් අංක **086-1-001-2-1190316** දරණ මහජන බැංකු ගිණුමට (තිඹිරිගස්යාය ශාඛාව) බැර වන සේ යෝග්‍යතා පරීක්ෂණ ගාස්තුව වන **රු. 2000.00** ක මුදල පහත පරිදි ගෙවිය හැකිය.
   - අ) අයදුම් පත්‍රයේ ඇති උපදෙස් අනුව ඔබගේ ණය/හර කාඩ්පත භාවිතා කරමින් මාර්ගගත ගෙවීම් ක්‍රමය භාවිතා කිරීම.
   - ආ) අයදුම් පත්‍රයේ ඇතුළත් මුදල් ගෙවීමේ වවුචරය බාගත කර යෝග්‍යතා පරීක්ෂණ ගාස්තුව (රු. 2,000/-) මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවීම.
   - ඇ) අන්තර්ජාල බැංකු පහසුකමක් භාවිතා කර ගාස්තුව (රු. 2,000/-) UCSC ගිණුම් අංකයට මාරු කිරීම.

ඇ) බැංකුව වෙත ගොස් (onsite)/ මාර්ගගත (online) බැංකු ගණුදෙනුවේදී බැංකුව විසින් නිකුත් කරන ලද ගෙවීම් කුවිතාන්සිය දී ඇති උපදෙස් අනුව අයදුම් පත්‍රයේ අදාළ කොටසට උඩුගත (upload) කළ යුතුය.

ඉ) චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

ඊ) ATM යන්ත්‍ර හරහා සිදුකරන ගෙවීම් භාරගනු නොලැබේ.

**සැලකිය යුතුයි**

i. නියමිත විශ්වවිද්‍යාල ප්‍රවේශ අවශ්‍යතා සපුරාලන අයදුම්කරුවන් වෙත පමණක් යෝග්‍යතා පරීක්ෂණය සඳහා විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

ii. අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සඳහා යෝග්‍යතා පරීක්ෂණ ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

iii. පහත දක්වා ඇති කරුණු මත ඔබගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප විය හැකිය
අ) අපේක්ෂකයා විසින් තොරතුරු පද්ධති උපාධි පාඨමාලාව සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබීම;
ආ) අයදුම් පත්‍රය අසම්පූර්ණ වී තිබීම;

iv. විභාග ප්‍රවේශ පත්‍රය (Admission card) 2022.09.27 දින සිට ඉල්ලුම් කිරීමේ පද්ධතිය (application system) https://ucsc.cmb.ac.lk/istest/ මඟින් බාගත (download) කලයුතුය. එසේ බාගත් (Download) ප්‍රවේශ පත්‍රය A4 ප්‍රමාණයේ සුදු කඩදාසිවල පමණක් මුද්‍රණය කර ගත යුතුය. ප්‍රවේශ පත්‍රය සහතික කරගෙන විභාගයට පැමිණීම අනිවාර්ය වේ. **විභාග ප්‍රවේශ පත්‍රය කිසිදු අපේක්ෂකයකු වෙත තැපැල් මගින් එවනු නොලැබේ.**

v. යෝග්‍යතා පරීක්ෂණයේ ප්‍රතිඵල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවනු ලබන අතර කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ (www.ucsc.cmb.ac.lk) සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (https://www.sjp) වෙබ් අඩවි වල පල කරනු ලැබේ.

vi. යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීම පමණක් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිගණක පීඨයේ තොරතුරු පද්ධති උපාධි පාඨමාලාවට ඇතුළත් කර ගැනීම සඳහා සුදුසුකමක් නොවේ. අපේක්ෂකයින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් නිකුත් කරන ලද "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වීම - අධ්‍යයන වර්ෂය 2021/2022" පිළිබඳ අත්පොතෙහි ඇති අයදුම් පත්‍රය මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය.

යෝග්‍යතා පරීක්ෂණයේ කොන්දේසි පිළිබඳ වැඩි විස්තර සඳහා;

**https://ucsc.cmb.ac.lk/istest/**

අයදුම් කිරීම හෝ යෝග්‍යතා පරීක්ෂණය සම්බන්ධයෙන් සියලු විමසීම් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/විභාග හා ලියාපදිංචි අංශය වෙත පහත විද්‍යුත් ලිපිනය මඟින් යොමුකල යුතුය. (sarexam@ucsc.cmb.ac.lk).

අධ්‍යක්ෂ
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය
අගෝස්තු, 2022